# අතුරු වෛද්‍ය සේවා ඛණ්ඩ - 2 සේවා ගණයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මහනුවර මහා නගර සභාවෙහි වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී තනතුර සඳහා වන උසස් කිරීමේ පරිපාටිය

01. සම්බන්ධ වන ආයතන.

1.1 මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශය.

| යොමු අංකය: | දිනය: |
|---|---|
| CPC/CLG/1/9/6 | 2014.07.26 |

1.2 මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය.

| යොමු අංකය: | දිනය: |
|---|---|
| CPC/CMS/01/07/23-2 වෙළුම | 2014.08.06 |

1.3 මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය.

| යොමු අංකය: | දිනය: |
|---|---|
| CPC/CS/2/3/S M/C (II) | 2014.09.03 |

1.4 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය.

| යොමු අංකය: | දිනය: |
|---|---|
| NPC/10/71/KMC/SR | 2015.11.19 |

1.5 මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය.

| යොමු අංකය: | දිනය: |
|---|---|
| CPC/PSC/13/CLG/රසායනාගාර කාර්මික ශිල්පී | 2015.12.08 |

**02. පරිපාටියේ නම** : මෙම සේවා පරිපාටිය අතුරු වෛද්‍ය සේවා ඛණ්ඩ - 2 **සේවා ගණයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මහනුවර මහ නගර සභාවෙහි වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී තනතුර සඳහා වන උසස් කිරීමේ පරිපාටිය** ලෙස හඳුන්වනු ලැබේ.

**03. ක්‍රියාත්මක වන දිනය** : මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරනු ලබන දින සිට ක්‍රියාත්මක වේ.

**04. උසස් කිරීම් බලධරයා පිළිබඳ විස්තර**

**උසස් කිරීම් බලධරයා** : මධ්‍යම පළාතේ ආණ්ඩුකාරතුමිය විසින් බලය පවරන ලද මධ්‍යම පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ පාලනයට යටත් වේ.

**05. නිලධර ගණය පිළිබඳ විස්තර**

5.1 නිලධර ගණය : **මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ අතුරු වෛද්‍ය සේවා - ඛණ්ඩ 2**

5.2 සංයුතිය : මධ්‍යම පළාතේ මහනුවර මහ නගර සභාවෙහි රසායනාගාර කාර්මික ශිල්පී තනතුරේ සංයුතිය පහත දැක්වෙන පරිදි වේ.

III , II, I ශ්‍රේණිය

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2016.01.19 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

5.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය : ආයතනයන්හි විධායක, කළමනාකරණ හා පරිපාලන යන මට්ටම්වල නියුතු වුවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා/හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් විශේෂිත තාක්‍ෂණික නිපුණතාවයන්, එනම් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) මට්ටම හය(06) යටතට ගැනෙන්නාවූ ද පාඨමාලා කාලසීමාව මාස 24ට වැඩිවූද අදාළ තාක්‍ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා හිමිකර ගත යුතු නිපුණතා අවශ්‍ය වන කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරෙන් පත්කිරීම් බලධාරියා විසින් සුවිශේෂිකොට දක්වනු ලබන කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

06. තනතුරේ ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ.

07. අර්ථ නිරූපණ හා නිර්වචන :

7.1 **"පරිපාටිය"** යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාතේ මහනුවර මහ නගර සභාවෙහි රසායනාගාර කාර්මික ශිල්පී තනතුරේ උසස් කිරීමේ පරිපාටියයි.

7.2 " **ආණ්ඩුකාරතුමිය** " යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවරයා වේ.

7.3 **"රාජ්‍ය සේවා කොමිෂන් සභාව"** යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

7.4 **"ලේකම්"** යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

7.5 **"දෙපාර්තමේන්තු ප්‍රධානියා"** යනුවෙන් අදහස් කරනුයේ මහනුවර මහ නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වේ.

7.6 **"කොමසාරිස් "** යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන කොමසාරිස්වරයා වේ.

7.7 **"සේවය"** යනුවෙන් අදහස් කරනුයේ **මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ** මධ්‍යම පළාතේ මහනුවර මහ නගර සභාවෙහි රසායනාගාර කාර්මික ශිල්පී තනතුරේ සේවයයි.

7.8 **"සක්‍රිය සේවා කාලය"** යනුවෙන් අදහස් කරනුයේ රජයේ, මධ්‍යම පළාත් සභාවේ හා පළාත් පාලන ආයතනවල වුවමනාවන්ට හෝ/හා රජයේ, මධ්‍යම පළාත් සභාවේ හා පළාත් පාලන ආයතනවල ප්‍රතිපත්තිමය හේතුවලට යටත්ව ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින්, තමාට පැවරෙන රාජකාරියෙහි සත්‍ය වශයෙන්ම සේවය කරන ලද කාල සීමාව වේ.

7.9 **"ක්‍රියාත්මක වන දිනය"** යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් මෙම පරිපාටිය අනුමත කරනු ලබන **දිනයයි.**

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2016.01.19 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

7.10 " සතුටුදායක සේවා කාලය" යනුවෙන් අදහස් කරනුයේ,

(i) රජයේ නිලධරයකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මගින්ද, සමත්විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම සමත්වීම මගින්ද, සිදුකළ යුතුව තිබූ පත්වීම් ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද, එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්ද වූ කාල සීමාවක් වන්නේය.

(ii) නිලධරයා වෙත ලබාදිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නිත්‍යානුකූල හේතූන් මත අත්හිටුවා, අඩුකොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එයද ආයතන සංග්‍රහයේ II කොටසේ වැරදි පිළිබඳව පළමුවැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර තුනක කාලයක් ද සහ ආයතන සංග්‍රහයේ II කොටසේ වැරදි පිළිබඳව දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදුකරනු ලැබූ දින සිට එක් වසරක කාලයක්ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය.

08. වැටුප්

8.1 වැටුප් කේත අංකය :- MT 05 – 2006 (A)

8.2 වැටුප් පරිමාණය :- 15260/ - 6x180-4x240-11x320-20x360-28,020/-

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රුපියල්) |
|---|---|---|
| III | ආරම්භක පියවර | 15260 /- |
| II | 12 පියවර | 17620/- |
| I | 23 පියවර | 21180/- |

සටහන - මහනුවර මහා නගර සභාවේ දැනට මෙම තනතුරේ සේවය කරන නිලධාරියාට MT 05- 2006 A අනුව වැටුප් ගෙවීම සිදුකරන බැවින් කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක: DMS /D1/91/26/VO1- I හා 2013.11.20 දිනැති ලිපියෙන් එම නිලධාරියාට පමණක් පෞද්ගලික වන සේ MT 05- 2006 A වැටුප් කේතය යටතේ වැටුප් ගෙවීම අනුමත කර ඇත.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2016.01.19 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

09. සේවා ගණයට අයත් තනතුරු :

9.1

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| **අතුරු වෛද්‍ය සේවා ඛණ්ඩ 2 සේවා ගණයේ** මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මහනුවර මහ නගර සභාවෙහි වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී.<br>(මධ්‍යම පළාත් රාජ්‍ය සේවයට බඳවා ගත් සහ වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය මත දැනට සේවයේ යෙදී සිටින නිලධාරියාට පමණක් පෞද්ගලික වන සේ වැටුප් ක්‍රමය ලබාදී ඇති මහනුවර මහා නගර සභාවේ වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී තනතුර) | 01 | I. ජල පවිත්‍රාගාරයේ ස්ථාන භාර නිලධාරී සමඟ සිදුකරන කාර්යයන් තුළ පවිත්‍රාගාරයට ගඟෙන් සපයන ජලයේ බොරතාවය,පී.එච්.අගය සෑම දිනකම පැයකට වරක් පරීක්ෂා කිරීම.<br>II. පිරිපහදුවට අවශ්‍යය රසායන ද්‍රව්‍ය යෙදීම හා පාලනය සිදුකිරීම.<br>III. ඉහත විශ්ලේෂණ පදනම් කරගෙන ක්ලෝරිණිකරණය පිළිබඳ සහතිකවීම.<br>IV. ගඟෙන් ලබා ගන්නා ජලය හා පවිත්‍රකරණය ජලය දිනපතා, සතිපතා, මාසිකව සිදුකරන පරීක්ෂාවන් ලේඛනගත කිරීම.<br>V. නාගරික රස පරීක්ෂණාගාරය හා සම්බන්ධ ආයතනවල රසායන ද්‍රව්‍ය සාම්පල විශ්ලේෂණය හා වාර්තා කිරීම<br>VI. එම කාර්යන්ට අදාළ රසායන ද්‍රව්‍ය හා භාණ්ඩ ඇණවුම් කිරීම, ලබාගැනීම ඒ පිළිබඳ තත්ත්ව සහතික ලබාදීම,<br>VII. මහනුවර නගරය තුළ ජල සාම්පල විශ්ලේෂණය<br>VIII. වසංගත රෝග තත්ත්ව පවතින විට අදාළ පරීක්ෂාවන් සඳහා සාම්පල් මහ රෝහලට හෝ අදාළ ආයතන වෙත යොමු කර උපදෙස් ලබාගැනීම හා ඒ සඳහා හේතු කාරක සොයා ගෙන ඒවා වළක්වා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම සහ මෙවැනි අවස්ථාවලදී සාමාන්‍ය පරීක්ෂණ වාර ගණනකට වඩා වැඩි වාර ගණනක් පරීක්ෂණ පැවැත්වීම<br>VIII. ජලයේ තත්ත්ව පරීක්ෂාවන් පැවැත්වීම<br>IX. භෞතික ,රසායනික හා ක්ෂුද්‍ර ජීවී යන අංශ ආවරණය වන පරිදි ක්ෂේත්‍ර අධීක්ෂණය<br>X. ජල සාම්පල් පරීක්ෂාව හා සම්බන්ධ ක්ෂේත්‍ර පරීක්ෂණයන්<br>XI. ජල පිරිපහදු අධීක්ෂණය |

9.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : මෙම උසස් කිරීම් පරිපාටිය අනුමත වන දින වන විට සේවයේ යෙදී සිටින නිලධාරීන්ගෙන් ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II හා I ශ්‍රේණින් ඒකාබද්ධ ශ්‍රේණි ලෙස සැලකේ. III, II හා I ඒකාබද්ධ ශ්‍රේණින් හි නිලධාරී සංඛ්‍යාව 01 කි.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2016.01.19 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

10. කාර්යක්ෂමතා කඩඉම්

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වාභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවා ගෙන / උසස් වී වසර 03 ක් ගතවීමට පෙර | ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණය (උපලේඛන 01) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස්වී වසර 03ක් ගතවීමට පෙර | ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණය (උපලේඛන 02) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස්වී වසර 05 ක් ගතවීමට පෙර | ප්‍රායෝගික පරීක්ෂණය (උපලේඛන 03) |

10.1. ප්‍රායෝගික පරීක්ෂණයේදී ලකුණු ලබාදීමේ පදනම - (01, 02, උපලේඛනවල (01) ඡේදයේ II හි සහ 03 උපලේඛනයේ (01) ඡේදයෙ I හි ඇතුළත්වේ)

10.2 ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය විසින් රසායනාගාරයක් තුළදී හෝ වෙනත් සුදුසු ස්ථානයකදී 01 හා 2 උපලේඛනයන්හි (01) හි II ඡේදයේ සහ 03 උපලේඛනයේ (01) ඡේදයේ I හි සඳහන් පරිදි අපේක්ෂකයාගේ ප්‍රායෝගික දැනුම පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂණ මණ්ඩලය ලබා දෙන ලකුණු නිර්ණායක මත ලකුණු 100 කින් 50 ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් උපයා ගත යුතුය.

10.3 ප්‍රායෝගික පරීක්ෂණය සඳහා අදාළ විෂය පිළිබඳ විශේෂඥ දැනුම සහිත මණ්ඩලයක් පත්වීම් බලධාරියා විසින් පත් කරනු ඇත.

10.4 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය වසරකට වරක් පවත්වනු ලැබේ.

10.5 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණය මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ ඉල්ලීම පරිදි මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පවත්වනු ලබයි.

11. ශ්‍රේණි උසස් කිරීම

11.1 III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

(i) පත්වීම ස්ථිර කර තිබීම.

(ii) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

(iii) අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

(iv) උසස් කිරීමේ දිනට පූර්වාසන්නම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(v) අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව නියමිත කාලය තුළදී ලබාගෙන තිබීම.

(vi) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

ගරු ආණ්ඩුකාරතුමිය විසින් 2016.01.19 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

11.1.1 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයා II ශ්‍රේණියට උසස් කිරීම සඳහා උසස්කිරීම් බලධරයා වෙත නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, උසස් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

11.2 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

(i) සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

(ii) අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

(iii) උසස් කිරීමේ දිනට පූර්වාසන්නම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(iv) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

11.2.1 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයා I ශ්‍රේණියට උසස් කිරීම සඳහා උසස්කිරීම් බලධරයා වෙත නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, උසස් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස්වීම් සිදු කරනු ලැබේ.

12. තනතුරුවලට පත් කිරීම : අදාළ නොවේ.

13. සේවයේ යෙදී සිටින්නන් අන්තර්ග්‍රහණය කිරීම

උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දින දක්වා කාලය තුළ මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයට බඳවා ගත් සහ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය මත MT 05 – 2006(A) වැටුප් ක්‍රමය ලබා දී ඇති දැනට තනතුර දරන නිලධාරියාට පමණක් පෞද්ගලික වන සේ මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ මහනුවර මහ නගර සභාවෙහි වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී තනතුර සඳහා වන උසස් කිරීම් පරිපාටියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

13.1 පොදු කරුණු :

I. නිලධරයා විසින් අන්තර්ග්‍රහණය කිරීමට මනාපය පළ කරනු ලබන්නේ නම් ආයතන ප්‍රධානියා මඟින් මෙම උසස් කිරීමේ පරිපාටියෙහි උපලේඛන 05 හි දැක්වෙන ආකෘති පත්‍රයට අනුව අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

II. ආයතන ප්‍රධානියා විසින් එම අයදුම්පත මෙම පරිපාටිය ප්‍රකාශයට පත් කිරීමෙන් මාස තුනක් (03) ඇතුළත මධ්‍යම පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය.

III. මධ්‍යම පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් ඉල්ලා සිටිනු ලබන වෙනත් අවශ්‍ය ලිපිලේඛන හෝ විස්තර සැපයීමට ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතුය.

IV. අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයාට විධිමත් පරිදි අන්තර්ග්‍රහණය කිරීමේ ලිපියක් මධ්‍යම පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කිරීමට කටයුතු කරනු ඇත.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2016.01.19 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

13.2 ක්‍රමවේදය

13.2.1 - I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම

වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී තනතුරේ වසර 14 ක් හෝ ඊට වැඩි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නියමිත කාර්යක්ෂමතා කඩඉම් සමත් සහ වැටුප් වර්ධක සියල්ල උපයාගැනීමෙන් අනතුරුව අදාළ නිලධරියා මෙම සේවා ව්‍යවස්ථාවේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

14. මෙම පත්වීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි මධ්‍යම පළාත් සභා මුල්‍ය රීති සහ රජය/ මධ්‍යම පළාත් රාජ්‍ය කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීති රීති හා/ හෝ රෙගුලාසි අදාළ වේ.

15. අන්තර්කාලීන විධිවිධාන :

අන්තර්ග්‍රහණ ක්‍රියාවලිය යටතේ මෙම සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මෙම ව්‍යවස්ථාවේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් සහ අනෙකුත් අවශ්‍යතා සපුරා ගත යුතුය. කෙසේ වෙතත් මෙම නිලධාරයා අන්තර්ග්‍රහණයට පෙර මෙම තනතුර සඳහා පෙර පැවති අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් නියමිත ශ්‍රේණියෙහි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව ඇත්නම් හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 20/2001 හි විධිවිධාන පරිදි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කිරීමේ හැකියාව ඇත්නම්, මෙම ව්‍යවස්ථාවේ සඳහන් අදාළ කාර්යක්ෂමතා කඩඉමෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කෙරේ.

16. සේවා අවශ්‍යතාවය මත ඉදිරියේදී බඳවා ගනු ලබන සියළුම නිලධාරීන් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 පරිදි MT 02– 2006(A) වැටුප් ක්‍රමය මත නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වේ.

17. මෙම උසස් කිරීමේ පරිපාටියෙහි විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් මධ්‍යම පළාත් සභාවේ ආණ්ඩුකාරතුමිය විසින් තීරණය කරනු ලැබේ.

18. අතුරු වෛද්‍ය සේවා බණ්ඩ - 2 සේවා ගණයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මහනුවර මහා නගර සභාවෙහි වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී තනතුර සඳහා වන උසස් කිරීමේ පරිපාටිය 2015 දෙසැම්බර් මස 15 දින රැස්වූ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදි.

| නම | | අත්සන |
|---|---|---|
| 01. ගාමිණී දසනායක මහතා | (සභාපති) | ........ |
| 02. යූ.ඒ. බෝගහපිටිය මහතා | (සාමාජික) | ........ |
| 03. පී.පී.එස්.ඒ. දිසානායක මිය | (සාමාජික) | ........ |
| 04. වී. නන්දකුමාර් මහතා | (සාමාජික) | ........ |
| 05. ඒ.ජේ.එම්.එම්. නිස්තාර් මහතා | (සාමාජික) | ........ |

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය :

අනුමත කරමි/නොකරමි

........

සුරංගනී එල්ලාවල
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
2016.01.19

උපලේඛන අංක 01

**අතුරු වෛද්‍ය සේවා බණ්ඩ - 2 සේවා ගණයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මහනුවර මහා නගර සභාවෙහි වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී තනතුරේ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

01. පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අදාළ විෂය නිර්දේශය

| විෂය | කාලය | ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| I. පොදු පරිපාලනය හා ජල පිරිපහදු ක්‍රියාවලිය සම්බන්ධ රසායනාගාර මූලධර්ම ලිඛිත ප්‍රශ්න පත්‍රය | පැය 02 | 100 | 40 |
| II. ප්‍රායෝගික පරීක්ෂණය (ජල සාම්පාලන විශ්ලේෂණය (භෞතික හා රසායනික) | පැය 02 | 100 | 50 |

**විෂයය නිර්දේශය:-**

02 . ආයතන සංග්‍රහයේ II,IV,හා VI පරිච්ඡේද සහ මුදල් රෙගුලාසි II පරිච්ඡේදයේ 90,91,93 , 95 සහ 101,102,104,105,108,109, හා 110 යන කොටස් ඇතුළත්ව ,

03. අ. ජල පිරිපහදුවට යොදන රසායන ද්‍රව්‍යවල ක්‍රියාකාරිත්වය
ආ. ක්ලෝරීනකරණ ක්‍රමවේදය
ඇ. ජල බැක්ටීරියා විද්‍යාව
ඈ. ජල සාම්පලවල අඩංගු සංයුතීන් වර්ගවල විස්තරාත්මක ව්‍යුහය (භෞතික රසායනික)

04. රසායනාගාර උපකරණ නඩත්තු

05. පහත කරුණු පිළිබඳ දෙපාර්තමේන්තු ක්‍රියාපටිපාටිය

අ. උපකරණ හා රසායන ද්‍රව්‍ය ඉල්ලුම් කිරීම
ආ. ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලබාගැනීම හා පවත්වා ගෙන යාමේ ක්‍රියාපරිපාටිය
ඇ. නිවාඩු වැටුප් රහිත නිවාඩු කෙටි නිවාඩු පිළිබඳව
ඈ. මුදල් රෙගුලාසි II පරිච්ඡේදයේ 90,91.93, සහ 95 වැනි කොටස්

06. මෙම පරීක්ෂණය මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ ඉල්ලීම පරිදි මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පවත්වනු ලබයි.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2016.01.19 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

උපලේඛනය 02

## අතුරු වෛද්‍ය සේවා බණ්ඩ - 2 සේවා ගණයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මහනුවර මහා නගර සභාවෙහි වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී තනතුරේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

01. දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අදාළ නිර්දේශ

| විෂය | කාලය | ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| I. පොදු පරිපාලනය හා ජල පවිත්‍රාගාරයක් සැලසුම් කිරීම නඩත්තු සහ සම්පූර්ණ ක්‍රියාවලිය, පිරිපහදුව, ජල මුලාශ්‍රයෙන්ගේ දුෂණය සහ ඊට අදාළ රසායනාගාර තාක්ෂණ මුලධර්ම | පැය 02 | 100 | 40 |
| II. ප්‍රායෝගික පරීක්ෂණය<br>ජල සාම්පල විශ්ලේෂණය (භෞතික,රසායනික හා ක්‍ෂුද්‍ර ජීවී) | පැය 02 | 100 | 50 |

**විෂය නිර්දේශය**

02. ආයතන සංග්‍රහයේ V,VIII,XII හා XIII යන කොටස් ඇතුළත්ව සහ මුදල් රෙගුලාසි 751,752, 753,754,755,756,757,758,759,760,761,762,763 සහ 4 වන කොටසේ 767,770,771 හා 772 යන කොටස් ඇතුළත්ව

03.

අ. ජල පවිත්‍රාගාරයක් සැලසුම,එක් එක් අදියරවලදී සිදුවන සම්පූර්ණ රසායනික හා ජීව විද්‍යාත්මක ක්‍රියාවලීන්

ආ. ජල සාම්පලවල අඩංගු විවිධ සංයුතීන්ගේ හඳුනා ගැනීම ඇති වන අහිතකර,ප්‍රතිපල හා ඒවා වළක්වා ගත හැකි ක්‍රම

ඇ. පරීක්ෂණ හා ගණනය කිරීම ඇසුරෙන් ජලයේ බොරතාවය සහ කැටිකාරකය අතර සම්බන්ධය

ඈ. ජල මුලාශ්‍රයන්ගේ ගුණාත්මක බව ආරක්ෂා කර ගැනීමේ ක්‍රම

ඉ .ජල දුෂණය හා අපජලයේ ඇති විවිධ පාරමිතීන් හඳුනා ගැනීම , ඒවායේ රසායනික ක්‍රියාකාරීත්වය, ප්‍රතිඵල සහ ගතයුතු පිළියම් (BOD,COD පරීක්ෂා ඇතුළත්)

ඊ. වෙනත් විෂබීජ නාශක ක්‍රමවේදයන්, ක්ලෝරීණිකරණයේ රසායන විද්‍යාත්මක වැදගත්කම සහ ක්ලෝරීණිකරණයේ බිඳවැටුම් ලක්‍ෂ්‍යය.

උ. ජල පිරිපහදු රසායන ද්‍රව්‍යයන්ගේ විශ්ලේෂණයන් සහ පිරිවිතරයන්ගේ විස්තරාත්මක ව්‍යුහය හා ඒවායේ වැදගත්කම

04. මෙම පරීක්ෂණය මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ ඉල්ලීම පරිදි මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පවත්වනු ලබයි.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2016.01.19 ..... දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

උපලේඛනය 03

**අතුරු වෛද්‍ය සේවා ඛණ්ඩ - 2 සේවා ගණයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මහනුවර මහා නගර සභාවෙහි වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී තනතුරේ තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

01. තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අදාළ නිර්දේශ :

| | විෂය | කාලය | ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1. | ප්‍රායෝගික පරීක්ෂණය<br>ජල සාම්පල විශ්ලේෂණය<br>(භෞතික,රසායනික හා ක්ෂුද්‍ර ජීවී) | පැය 02 | 100 | 50 |

**විෂය නිර්දේශය**

02. අ. රසායනාගාර උපකරණ නඩත්තුව,

ආ. ජල පවිත්‍රාගාරයක් සැලසුම් කිරීම,නඩත්තුව ,ඇතුළුව රසායනික හා ජීව විද්‍යාත්මක ක්‍රියාවලීන් , ජල පිරිපහදු රසායන ද්‍රව්‍යයන්ගේ විශ්ලේෂණයන් සහ පිරිවිතරයන්ගේ විස්තරාත්මක ව්‍යුහය හා ඒවායේ වැදගත්කම

ඇ. ජල මූලාශ්‍රයන්ගේ ගුණාත්මක බව හා ජලයේ බොරතාවය ,කැටිකාරකය අතර සම්බන්ධය,ජල දූෂණය හා අපජලයේ ඇති විවිධ පාරමිතීන් හඳුනා ගැනීම , ඒවායේ රසායනික ක්‍රියාකාරීත්වය (BOD,COD පරීක්ෂා ඇතුළත්ව)

ඈ. ජල මූලාශ්‍රයන්ගේ ගුණාත්මක බව ආරක්ෂා කර ගැනීමේ ක්‍රම

ඉ. වෙනත් විෂබීජ නාශක ක්‍රමවේදයන්,ක්ලෝරීණිකරණයේ රසායන විද්‍යාත්මක වැදගත්කම සහ ක්ලෝරීණිකරණයේ බිඳවැටුම් ලක්ෂ්‍යය.

යන කරුණු ආශ්‍රිතයෙන් ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ. එමගින් අපේක්ෂකයාගේ නිර්මාණශීලීත්වය ගැටළු හඳුනා ගැනීම,ගැටළු විශ්ලේෂණය,හා නිවැරදි තීරණ ගැනීමේ හැකියාව සහ න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව යොදා ගැනීම පිළිබඳව ඔවුන් තුළ පවත්නා අවබෝධය පරීක්ෂාවට භාජනය කරනු ලැබේ.

03. මෙම පරීක්ෂණය මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ ඉල්ලීම පරිදි මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පවත්වනු ලබයි.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2016.01.19 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

උපලේඛනය - 04

අතුරු වෛද්‍ය සේවා බණ්ඩ - 2 සේවා ගණයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මහනුවර මහා නගර සභාවෙහි වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී තනතුරේ

**II, සහ I ශ්‍රේණි උසස් වීම ලබා ගැනීම සඳහා වූ අයදුම්පත්‍රය**

**1.** නිලධරයා පිළිබඳ තොරතුරු
- 1.1. අයදුම්කරුගේ සම්පූර්ණ නම : ............................................
- 1.2. හැඳුනුම්පත් අංකය : ............................................
- 1.3. සේවා ස්ථානය සහා එහි ලිපිනය : ............................................
- 1.4. අයත්වන සේවය හා තනතුර : ............................................
- 1.5. අයත්වන සේවා ගණය හා ශ්‍රේණිය : ............................................

**2.** පත්වීම පිළිබඳ තොරතුරු
- 2.1. පත්වීම් දිනය : ............................................
- 2.2. පත්වීම ස්ථිර කළ දිනය : ............................................
- 2.3. සමත්වු කාර්යක්ෂමතා කඩඉම හා සමත් වු දිනයඃ

| සමත්වු කාර්යක්ෂමතා කඩඉම | සමත්විය යුතු දිනය | සමත් වු දිනය |
|---|---|---|
| | | |

- 2.4. සමත් වු භාෂා ප්‍රවිණතා මට්ටම හා සමත් වු දිනයඃ

| සමත්වු භාෂා ප්‍රවීණතා මට්ටම | සමත්විය යුතු දිනය | සමත් වු දිනය |
|---|---|---|
| | | |

**3.** උසස් වීමට අදාළ තොරතුරු
- 3.1. උසස් වීමට අපේක්ෂිත ශ්‍රේණිය : II/I
- 3.2. උසස් වීමට අපේක්ෂිත ධාරාව : සාමාන්‍ය
  (බඳවා ගැනීමේ පරිපාටි හෝ සේවා ව්‍යවස්ථාවේ අදාළ කොටසේ ඡායා පිටපතක් අමුණන්න)
- 3.3. උසස්වීම ලබා ගැනීමට අපේක්ෂා කරනුයේ සාමාන්‍ය කාර්ය සාධනය යටතේ නම්,
  - 3.3.1. අවශ්‍ය සක්‍රිය සේවා කාලය සම්පූර්ණ තිබේද? ඔව්/නැත
  - 3.3.2. සේවා කාලය සම්පූර්ණ කළ දිනය : ....................................
  - 3.3.3. අපේක්ෂිත සක්‍රිය සේවා කාලය තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමේ සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද? ඔව්/නැත
  - 3.3.4. නියමිත වැටුප් වර්ධක සියල්ල උපයා ගෙන තිබේද? ඔව්/නැත
  - 3.3.5. උසස් වීමට පුර්වාසන්න පස් වසර/තෙවසර/දෙවසර තුල සතුටුදායක සේවා කාලයක් සම්පුර්ණ කර තිබේද? ඔව්/නැත

**4.** අයදුම්කරුගේ ප්‍රකාශය

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් .................................... දින සිට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ II/I/ ශ්‍රේණියට උසස් විමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය :- ගරු ආණ්ඩුකාරතුමිය විසින් 2016.01.19 දින අනුමත කරන ලදී. ආණ්ඩුකාර ලේකම්

..............................
නිලධාරියාගේ අත්සන

**5. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ඉහත නම සඳහන් ………………………………………………………………………………………මහතා/මෙනවිය/මහත්මිය……………………………………….. සේවා ගණයේ …………………… ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියළු කරුණු සම්පූර්ණ කර ඇති බවටත්, සෑහීමට පත් වෙමි. ඒ අනුව එම නිලධරයා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

නම :……………………………………

අත්සන :………………………………

දිනය :………………………………

නිලමුද්‍රාව :……………………………

**6. අමාත්‍යාංශ ලේකම්/පත්වීම් බලධරයා**

………………………..…………………………මහතා/මෙනවිය/මහත්මිය…………………
…………… සේවා ගණයේ ……………… ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ ………………… දින සිට උසස් කිරීම අනුමත කරමි/ නොකරමි

ගුරු ආණ්ඩුකාරතුමිය විසින්
2016.01.19 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

නම :………………………………
අත්සන :……………………………
දිනය :………………………………
නිලමුද්‍රාව :…………………………
(පරිපාලන බලධරයා)

## අතුරු වෛද්‍ය සේවා බණ්ඩ - 2 සේවා ගණයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මහනුවර මහා නගර සභාවෙහි වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී තනතුරේ උසස් කිරීමේ පරිපාටියට අනුව අන්තර්ග්‍රහණය සඳහා ඉල්ලුම් පත්‍රය

**I කොටස - අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුයි.**

1. ස්ථානය සහ ලිපිනය : ……………………………………………………………………………..

2. අයදුම්කරුගේ සම්පූර්ණ නම :…………………………………………………………………………
………………………………………………………… මෙනවිය/ මහත්මිය/ මහතා

3. (i) උපන්දිනය :………………………………… (ii) පරිපාටිය ක්‍රියාත්මක වන දිනට වයස :……..

4. දැනට දරන තනතුර :…………………………………………………………………………..

5. පත්වීමේ ස්වභාවය :…………………………………………………………………………..

5.1 තනතුරට අදාළ මුල් පත්වීමේ දිනය සහ ලිපියේ අංකය :…………………………………………

5.2 පත්වීම ස්ථිර කළ දිනය හා ලිපියේ අංකය :……………………………………………………..

6. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 9/2004 අනුව
   1. වැටුප් පරිමාණය :…………………………..
   2. වැටුප් කේත අංකය :…………………………..

7. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව,
   1. වැටුප් පරිමාණය :…………………………..
   2. වැටුප් කේත අංකය :…………………………..

8. දැනට සිටින තනතුරට බඳවා ගැනීමේ පරිපාටිය අනුව දැනට දරන තනතුරට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් :…………………………………………………………………………………………

9. රාජකාරි විස්තරය (සැකෙවින්) :……………………………………………………………………
…………………………………………………………………………………………………………

10. දැනට සිටින තනතුරට බඳවා ගනු ලැබූ බඳවා ගැනීමේ පරිපාටිය අනුව නියම කර ඇති කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් වූ දිනයන් :

| කාර්යක්ෂමතා කඩඉම් විභාගය | සමත් වූ දිනය |
|---|---|
| ……………………………………… | ……………………………… |
| ……………………………………… | ……………………………… |
| ……………………………………… | ……………………………… |

11. කාලය පිළිබඳ විස්තරය (අවශ්‍ය වේ නම් ඇමුණුමක් භාවිතා කරන්න)

| සිට | දක්වා | තනතුර | ස්ථානය | කාලය |
|---|---|---|---|---|
| | | | | |

12. ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

දිනය :………………………… 001 …………………………

අයදුම්කරුගේ අත්සන

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2016.01.19 …………………… දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

**2 කොටස - ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුයි.**

13. අයදුම්කරු විසින් 1 සිට 11 දක්වා සඳහන් කර ඇති තොරතුරු නිවැරදි අතර ( අදාළ වේ නම් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් වැටුප සඳහා නිර්දේශ ලබා දුන් ලිපියේ පිටපතක්ද ඉදිරිපත් කරමි) ඔහු/ ඇය මෙම සේවයට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි/ නොකරමි. (නිර්දේශ නොකරන්නේ නම් හේතු සඳහන් කළ යුතුයි)

දිනය : ..............................          ..........................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

**3 කොටස - මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය කොමිෂන් සභාවේ ප්‍රයෝජනය සඳහා**

14. අයදුම්කරු / අයදුම්කාරිය මෙම සේවයට අන්තර්ග්‍රහණය කරමි/ නොකරමි.

15. අන්තර්ග්‍රහණය නොකරන්නේ නම් ඊට හේතු : ..............................................................
.......................................................................................................................
.......................................................................................................................

16. අන්තර්ග්‍රහණය කරනු ලබන ශ්‍රේණිය :..........................................

..........................................          ..........................................

දිනය          බලය පැවරුණු නිලධාරියාගේ අත්සන

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2016.01.09 දින
අනුමත කරනු ලදී.
ආණ්ඩුකාර ලේකම්